ඔස්ට්‍රේලියාව

දේදුනු සර්පයා

ලේඛක

ඩික් රජ්සි

විත්‍ර

බෙන් කෝල්

හුහක් ඉස්සර, හීන ලෝකයේ, මිනිස්සු විතර යි හිටියේ. සතුන්, කුරුල්ලන්, ගහ කොළ, කඳු පර්වත මොකුත් තිබුණේ නැහැ. මුළු රට ම තැනිතලාවක්.

ගුරියල්ලා යන නම ඇති මහා දේදුනු සර්පයා, හිටි තැනින් ඇදිලා උගේම වර්ගයා හොයා ගෙන යන්නට පිටත් වුණා. ඌ ඔස්ට්‍රේලියාවේ දකුණේ ඉඳන් උතුරට ගියා.

කේප් යෝක් නම් තැනට ඌ ආවා. එතන ඌ නතර වෙලා, තරබුල්ගත් කියන ලොකු රතු කන්ද හැදුවා. හුළඟට කන් දී අහගෙන හිටියා. ඒත් ඌට ඇහුණේ අමුතු භාෂාවල් කතා කරන හඬ විතර යි. “මේ මගේ රට නෙමේ. මෙතන මිනිස්සු කතා කරන්නෙ වෙනත් භාෂාවක්. මගේ මිනිසුන්ව හොයන්ඩ තවත් ඈතට යන්ට වෙනවා.”

ගුරියල්ලා තරබුල්ගතින් පිට වෙලා ගියා. ඌ පාත් වුණු තැන උගේ විශාල ශරීරය හින්දා ගැඹුරු ඇලියක් හැදුණා. ඌ තවත් උතුරට ගියා.

හැම හැන්දෑවක ම නතර වෙලා උගේ ම අය ඉන්නවා ද කියලා දැන ගන්නට හුළඟට ඇහුම්කන් දුන්නා. දවස් ගණනාවක් තිස්සේ ඌ ගියා. ඌ උතුරට ගිය පාරේ දොළ පාරවලින් ගංගාවලින් මිටියාවත් හැදුණා.

තරබුල්ගතින් උතුරට යද්දී ගුරියල්ලා තවත් කඳු දෙකක් හැදුවා. තරඩුන්ගා කියන කන්ද දිගයි. ඒක කළුගලෙන් හැදුවේ. උස කඳු මුදුන් පහකුත් ගල්ගුහා පහකුත් තියෙන අනික් කන්දට නම දුන්නේ ගොර්මුන්ගන් කියලා.

ඊළඟට ඌ නැවතුණු තැන තමා පෙයාවිච් කියන තැන. එතන ඌ මානෙල් මල් තියෙන මීනලින්කා කියන කලපුව හැදුවා. ගුරියල්ලා, උගෙ විශාල ඇඟ එහාට මෙහාට ඇඹරුවා. ඒත් බිම හුඟක් තද හින්දා එය ගැඹුරට හාරන්ට බැරි වුණා.

එක දවසක් සුළගේ ගීත රාවයක් ඇහුණා. " ආර්ර්ර්, ආර්ර්ර්, ආර්ර්ර්" කියලා. "ආන්න මගෙ මිනිස්සු සින්දු කියනවා, එයාලා ලොකු

උත්සවයක් පවත්වනවා," ඌ කිව්වා. ඌ තව උතුරට යන්ට යන්ට ගී හඬ තව තව හයියෙන් ඇහුණා.

ගහවල් දෙක එකට යා වුණු තැන, ගුරියල්ලාට උගේ උදවිය හමු වුණා. ඒ මිනිස්සු නට නටා, සින්දු කිව්වා. ඒ මිනිස්සුත් බලන්නට ඌ හෙමින් බඩගා ගෙන ගිහින් හැංගිලා හිටියා. ඌ හුඟක් වෙලා බලා ඉඳලා එළියට ආවම උගේ උදවිය ඌ පිළිගත්තා.

ඒ මිනිසුන්ට ඌ මෙහෙම කිව්වා. " තුඹලා හරියට නටන්නෙ නෑ – හරියට ඇඳුම් ඇඳ ගෙන වත් නෑ. මං දිහා බලාපල්ලා. මං හරි විදිය පෙන්නන්නම්. " ඔළුව පිටි පස්සෙ මීඉටි ගුලියක් අලවලා, පිහාටු ඇර ගෙන ඔටුන්නක් හදාගන්න හැටි ගුරියල්ලා මිනිසුන්ට පෙන්වා දුන්නා.

මිනිසුන්ගේ අත්වලට වැටකෙයියා අත්–වළලු දැම්මා. නාස් පුඩු හරහා සුදු ඇට කටු ඇමුණුවා. ඊට පස්සේ නටන්නට ඉගැන්නුවා. ඌ දිහා බලා ගෙන මහත්සි වෙන තුරු ම ඒ මිනිස්සු නැටුවා.

එතකොට ලොකු කුණාටුවක් එන ලකුණු පෙනුණා. ඒ හින්දා මිනිස්සු ඔක්කෝම අතුපැළවල් හදා ගත්තා.

බිල් – බිල් සහෝදරයන් කියන තරුණයො දෙන්නා කුණාටුවෙන් බේරිලා ඉන්නට තැනක් හොයමින් දුව ගෙන ආවා. ඒත් කා ළඟවත් ඉඩක් තිබුණේ නැහැ.

ඊළඟට ඔවුන් තාරකා ගැණි නමැති ඔවුන්ගේ ආච්චිගෙන් ඉඩ ඉල්ලුවා. "මට බලු රැලක්ම ඉන්නවා. ළමයිනේ, ඒ හින්දා උඹලට උදව් කරන්න බෑ," ඈ කිව්වා.

බිල් – බිල් සහෝදරයන් ගුරියල්ලා ළඟට ගියා ම, ඌ උගෙ අතුපැළේ ගොරව ගොරවා නිදාගෙන ඉන්නවා පෙනුණා. ඔවුන් ඌට කතා කළා ම ඌ ඇනුමක් ඇරලා කිව්වා, " මට උඹලට දෙන්න ඉඩක් නෑ. " වැස්ස තව වැඩිවුණා. සහෝදරයන් දෙන්නා සෙවණක් හොයන්ට හැම තැන ම දිව්වා. ඒත් කවුරුවත් ඒ දෙන්නට උදව් කළේ නැහැ.

ඔවුන් ගුරියල්ලා ළඟට ආපහු ගිහින් කිව්වා වැස්ස තදින් ම වහින විත්තිය. ගුරියල්ලා කිව්වා, " හා හොඳයි, ඔහොම ඉන්නවා. මං මගෙ අතුපැළ තව ලොකු කරන්නම් කො." අතුපැළේ වහලට ගැටෙන තරම් ඌ පුළුවන් තරම් කට ඇරලා කිව්වා, " හා, දැන් ඇතුළට වරෙල්ලා."

බිල්-බිල් සහෝදරයො ගුරියල්ලාගෙ කට ඇතුළට දිව්වා. ඌ ඒ දෙන්නා ගිළ දැම්මා. ඊට පස්සෙ ඒ දෙන්නා නැති විත්තිය දැන ගත්තා ම උගෙ උදව්ය මොනවා කරාවි දැයි ඌට බියක් ඇතිවුණා. ඉබේ පිහිටලා තියෙන එක ම කන්ද වන බොර-බූතරු කන්දට තවත් උතුරට යා යුතුයි කියල ඌ තීරණය කළා.

පහුව දා උදේ මිනිස්සු එක් එක්කෙනාගෙන් ඇහුවා, බිල්-බිල් සහෝදයන් ට හෙවණ දුන්නෙ කවුද කියලා. ළමයින් දෙන්නා නැති වෙලා විත්තිය ඔවුන්ට තේරුම් ගියා. ගුරියල්ලා ගිය පාර දිහා බලපුවා ම මිනිස්සු දැනගත්තා ගුරියල්ලා සහෝදරයන් දෙන්නා ගිළලා තියෙන බව. මිනිස්සු හෙල්ල එල්ල කරගෙන ගුරියල්ලා පස්සෙ එලෙව්වා.

ඈත අහස උසට විහිදිලා තියෙන බොර-බුනරු කන්ද ළඟට යන්න ගුරියල්ලා හුඟක් දුර ආවා. කන්ද පාමුල තියෙන ගල්කුළු හමුවුණා ම ඒ උඩට ගුරියල්ලා බඩගාගෙන ගියා. බිල්-බිල් සහෝදරයන් බඩ ඇතුළෙ දමාගෙන ඌ වකුටු වෙලා නිදා ගන්නට ගියා.

මිනිස්සු ඉතා උස බොර-බුනරු කන්දෙ පාමුලට, ගුරියල්ලා පස්සෙන් ගියා. එමු, කලකුමා, බ්‍රොල්ගා, ඉබ්බා, පොසම් යනාදි සියලු දෙනාම ගල්කුළු නඟින්නට මහන්සි ගත්තා. ඒත් නැඟ ගන්නට බැරිව පහළට වැටුණා.

වන්ගු නැත්නම් ගස්ගෝන කියන සහෝදරයෝ එතනට ආවා. ගුරන් පී කියන එමුවා ඔවුන්ට කිව්වා, "අපට මේ උස කන්ද නඟින්ට අමාරු යි." එත කොට වන්ගු සහෝදරයො කිව්වා, "අපි දෙන්නා නැඟලා බිල්-බිල් සහෝදරයන් බේරා ගන්නවා." ඔවුන් තිරුවාණ ගලෙන් පිහියා දෙකක් හදා ගෙන, කන්ද නඟින්නට පටන් ගත්තා.

දවස් ගණනක් තිස්සේ ර. ගණනක් තිස්සේ වන්ගු සහෝදරයෝ කන්ද නැග්ගා. කඳු මුදුනට ගියා ම ගුරියල්ලා හොඳට ම ගොරව ගොරවා නිදාගෙන ඉන්නවා ඔවුන්ට දැක ගන්ට ලැබුණා.

උන්දෙන්නා ඌ ළඟට හෙමින් කිට්ටු වුණා. " අපි දැන් මූව පලාදමු. උඹ ඔතන පහළ ඉඳලා පටන් ගනින්. මං මෙතනින් පටන් ගන්නම්," වැඩිමලා කිව්වා.

බිල්-බිල් සහෝදරයන් හමු වෙන කල් ම ඔවුන් දෙදෙනා ගුරියල්ලා දෙබෑ කර ගෙන, කපාගෙන ගියා. බිල්-බිල් සහෝදරයෝ, දේදුනු සර්පයාගෙ පාට වැටුණු ලස්සන ගිරවු දෙන්නෙක් වෙලා. එත කොට

වන්ගු සහෝදරයෝ ඔවුන්ට මෙහෙම කිව්වා. "උඹලාට දැන් එළියට එන්ට පුළුවන්. උඹලා දැන් අත් තවු තියෙන දේදුනු පාට ලොරිකීට් ගිරවු. දැන් ඉතින් ඉගිල්ලිලා යතැකි."

බිල්-බිල් සහෝදරයෝ පියාඹා ගියා. වන්ගු සහෝදරයෝ කන්ද පහළට දුව ගෙන ආවා.

ගුරියල්ලා උගෙ හිස් බඩ ඇතුළට හීතල හුළං වැදිලා ඇහැරෙන තුරු ම ගොරව ගොරවා හිටියා. "මට තිකම් මොකක් ද වගේ දැනෙනවා," ඌ කිව්වා. ඌ වට පිට බැලුවා. එත කොට ඌට දකින්නට ලැබුණා උගෙ බඩ කපලා, කාපු කෑම අරන් විත්තිය.

ගුරියල්ලාට හොඳට ම කේන්ති ආවා. තරහෙන් ඒ අතට මේ අතට ගැහුවා. උගෙ දිග රතු දිව විදුලිය වගේ වැනුණා. තරහෙන් කන්ද සුණු විසුණු කරන්ට පටන් ගත්තා. විශාල කන්ද දෙදරලා ගියා. මුළු රට පුරාම ඌ කන්දෙ කෑලි විසිකරන්ට පටන් ගත්තා. ඒවායින් දැන් තියෙන කඳු පර්වත හැදුණා.

ගුරියල්ලා කන්ද සුණු විසුණු කරද්දී ඇති වෙච්ච ගෝසාවට ඔක්කොම මිනිස්සු බය වුණා. විසි වුණු ගල් වැදිලා සමහර මිනිස්සු මැරුණා. අනිත් අය බේරෙන්නට දුවන ගමන් අද ඒ රටේ දකින්නට තියෙන නොයෙක් අන්දමේ සතුන්, කුරුල්ලන්, කෘමියන්, ගහකොළ විදියට වෙස් ගත්තා.

එහෙම තමා ඒ හුඟාක් ඉස්සර, හීන ලෝකයේ සිද්ධ වුණේ. ගුරියල්ලාගෙ කේන්තිය සංසිඳිලා ගියා ම, විශාල බොරබුනරු කන්දෙන් ඉතුරු වෙලා තිබුණේ, පුංචි කන්දක් විතර යි. ගුරියල්ලා කන්දෙන් බැහැලා මූද පතුලට නොපෙනී ගියා. අද වෙන තුරු ම එහේ ඉන්නවා.

කලින් ගුරියල්ලාට බයේ මිනිස් වෙස් අත ඇරලා සතුන් ගහ, කොළන් බවට හැරිච්ච ඔක්කොම රූක බලා ගන්නට, ඉතිරි වෙලා හිටිය මිනිස්සුන්ට සිද්ධ වුණා. දැන් අහස හරහා වේගයෙන් දුව යන උල්කාපාතය තමයි, හැම දෙනා ම දිහා බලා ඉන්න ගුරියල්ලාගෙ ඇහැ.

වියට්නාමය

ගොවියා සහ කොටියා

(වියට්නාම් ජන කථා)

චිත්‍ර

න්ගුයෙන් ක්ෂුවන් තාං

හුහාක් ඉස්සර ඈත කාලෙ ලොකු කොටියෙක් හිටියා. ඌ තමා කැලේ සතුන්ගෙ රජා. උගෙ ලොම් කළු ම කළු යි. ඇස්, ගින්දර වගේ. දත් පිහිතල වගේ. මේ කොටියාට මුළු කැලෑව ම බය වෙලා හිටියේ. ඌ නොයෙක් සතුන් ගණනාවක් ම මරා ගෙන කෑවා.

එක දවසක්, උදේ වේලට මුවකු එහෙම පිටින් ම කාලා, කොටියා ගියා ඇවිදින්නට. ඌට බයේ සතුන් පැනලා දුවන හැටි බලලා ඌ හරි සන්තෝස වුණා. එතකොට ම ඌ දැක්කා ඌට අදහා ගන්න බැරි දෙයක්. කන්දක් පා මුල කුඹුරක, මීහරකෙක් හෙම්හිට හෙම්හිට නඟුලක් ඇද ගෙන යන හැටි. ඌ පිටි පස්සෙන්, තරුණ ගොවියෙක් ඌට කෑ ගසමින් උණ දණ්ඩකින් තළමින් යන හැටි.

කොටියා පුදුමයට පත් වුණා. උගෙ රාජ්‍යයේ කවුරු වත් ඌට එහෙම කවදාවත් සලකන්නෙ නෑ නොවැ ! මහන්සි ඇර ගන්නට ගොවියත් මීහරකත් වැඩේ නතර කරන තුරු ඌ හුහක් වෙලා බලා ගෙන හිටියා.

ඌ මීහරකා ළගට කිට්ටු වෙලා ඇහුවා, "යාළුවෙ, මට කියපන් කො – උඹ මොකද අර පුංචි මිනිහට ගහන්ට යි බනින්ට යි ඉඩ දෙන්නේ ? උඹ ඒ මිනිහට වැඩිය ලොකු යි, ඊට වඩා උඹට ශක්තිය තියෙනවා. ඔය පිහිය වගේ උල් වුණු අං දෙකෙන් ඇණලා මිනිහව ඕනෑ වෙලාවක මරලා දාන්ඩ උඹට පුළුවන්. මට නම් කොහෙත් ම තේරෙන්නෙ නෑ උඹ ඔච්චර මෙව්වල් මොකද කියලා."

මීහරකා ඔළුව උස්සලා කොටියා දිහා බලලා දුකෙන් කිව්වා, "ගොවිරාළ නම් පුංචි බව ඇත්ත යි. ඒ වුණාට දන්නේ නැද්ද – එයාට නුවණ තියෙන විත්තිය ? "

" මොකක් කිව්වා – නුවණ ?" කොටියා පුදුමෙන් ඇහුවා. " නුවණ කියන්නෙ මොකක් ද ?"

මීහරකා නොසන්සුන් වුණා. ඇයි – ඌ වත් දන්නේ නෑ නේ නුවණ කියන්නෙ මොකක් ද කියලා. ඌ දන්නෙ නැති විත්තිය කොටියාට කියන්නට ඌට වුවමනා කළේ නෑ. ඉතින් ඒ හිත්දා ඌ කිව්වා, " උඹ පිහිත් ගොවිරාළගෙන් ම අහගනින්. "

උණ බම්බු පයිප්පයක් උරමින් හිටි ගොවියා ළහට ගිහින් කොටියා ඇහුවා, "මී හරකා මා එක්ක කිව්වා තමුසෙට නුවණ තියෙනවා කියලා. ඒ ඇත්ත ද ?"

"ඔව්, ඒ ඇත්ත යි," ගොවියා කිව්වා. එත කොට කොටියා ඇහුවා, "ඒක මොකක් වගේ ද ? කරුණාකරලා මටත් ඒක බලන්ට ඉඩ දෙනවා ද ? "

" මටත් ආස යි උඹට ඒක පෙන්නන්න ඇත් නම්. ඒත් මේ කුඹුරෙ දි නැති වෙයි කියලා, මං ඒක අද උදේ ගෙදර තියලා ආවා නේ. "

" තමුසෙ ගිහිල්ලා ඒක අර ගෙන එනවද ? ඒක මොන වගේ ද කියලා, ඇත්තට ම මට දැක ගන්න ආස යි. "

" හොඳයි මං ගේන්නම්කො, " කියලා ගොවියා අඩි දෙක තුනක් ගියා. එක පාරටම ම නැවතිලා ආපසු ආවා. " මට දැන් යන්ට බෑ.

මට බය යි, මං නැති වෙලාවෙ උඹ මගෙ මීහරකව මරයි කියලා," ඔහු කිව්වා.

" මං මරන්නෙ නෑ කියලා පොරොන්දු වෙනවා. උදේට මුවෙක් මරන් කෑව හින්දා තව මත් මගෙ බඩ පිරිලා. ඒ හින්දා බය වෙන්ට දෙයක් නෑ."

ගොවියා ටිකක් වෙලා කල්පනා කරලා කිව්වා, " හොඳයි එහෙනම්, මං යනවා උඹව අර ගහේ ගැට ගහලා යන්ට මට ඉඩ දෙනව නම්. එතකොට මං බය වෙන්ට ඕනැ නෑ නේ, උඹ මගේ මීහරකා කාවි කියලා."

නුවණ කියන්නේ මොකකට ද කියලා බලා ගන්නට කොටියා හුඟාක් ආසාවෙන් හිටිය හින්දා, ඌව ගහේ බඳිනවාට ඌ කැමති වුණා. ඉතින් ගොවියා ඉක්මනට කොටියාව ගහේ බැන්දා. ඊට පස්සේ කොටියා වටේට දිරපු කොළ රොඩු යි දර කෝටු යි එකතු කරලා ගින්දර තියලා කිව්වා, " මෙන්න, මගේ නුවණ ! "

ගිනි දැල් සැරට ඉහළ නැංගා. කොටියාට හෙල්ලෙන්න විදියක් නෑ. ඌ ගින්දර මැද වේදනා විඳ විඳ, අසරණ වෙලා ඉන්නවා දැක්ක මීහරකා හිනා වෙලා, හිනා වෙලා, අන්තිමට ගෑක හැපිලා උඩු ඇන්දෙ දත් ටික කඩා ගත්තා.

බැඳලා තිබුණු ලණු පිළිස්සී ගියායින් පස්සේ යි කොටියාට ගින්නෙන් බේරෙන්නට පුළුවන් වුණේ. ඌ වේදනාවෙන් කෑ ගසමින් කැලෑවට පැන ගියා.

ගොවියගෙ ගින්නෙන් තැන් තැන් පිළිස්සුණු හින්දා එදා ඉඳලා උපදින කොටින්ගෙ ලොම් කළු පාට යි දුඹුරු පාට යි. එදා ඉඳලා උපදින මීහරකුන්ගෙත් උඩු ඇන්දෙ දත් නෑ !

කොරියානු ජනරජය

හැම වැහි දාක ම ගස් ගෙම්බා කෑ ගසන්නේ ඇයි ?

ලේඛක හා චිත්‍ර

කිම් යං - ජු

එකමත් එක රටක ගස් ගෙඹි පැටවෙක් ජීවත් වුණා, උගෙ අම්මත් එක්ක. මේ ගස් ගෙඹි පැටියා අම්මාට හරි ම අකීකරු යි. හැම දෙයක් ම කළේ තමන්ට ඕනෑ විදියට.

උගෙ අම්මා කිව්වොත්, " අනේ පුතේ, මම අද ගේ සුද්ද කරන්ට යන හින්දා, පුතා එළියට ගිහින් සෙල්ලම් කරන්ට, " කියලා, ඌ එළියට යන්නේ නැතුව, ගේ ඇතුළෙ එහේ මෙහේ දුවනවා. අම්මා කිව්වොත් කන්දට යන්න කියලා, ඌ යන්නෙ ගඟට, මෙහාට එන්න කිව්වොත් ඌ යන්නෙ එහාට.

ගස් ගෙඹි අම්මා හරියට දුක් වුණා. " හැම තිස්සෙ ම පුතා මට විරුද්ධ වෙන්නේ ඇයි ? පුතාගෙ මේ තරක පුරුද්ද කොහොම ද මං අත් අරවන්නෙ " කියා සුසුම් ලෑවා.

ගස් ගෙඹි පුතා හොඳින් දැන ගෙන සිටියා, ඌ නිසා උගෙ අම්මා දුක් වෙන විත්තිය. ඒත් උගෙ වැඩ ගැන කණගාටු වෙනවාට වැඩිය ඌ තව තවත් දඟකාර වුණා. ඌට කියන දෙයක අනික් පැත්ත කරන්නෙ කොහොම ද කියලයි ඌ හැම විට ම හිතුවේ. වෙන එකක් තියා, අන්තිමට ඌ කෑගහන්නට පටන් ගත්තා අනික් අතට. ඒ කියන්නේ අනික් ගස් ගෙම්බන් "බක ! බක ! බක !" ගාන කොට, මේ හිතුවක්කාර ගෙඹි පැටියා "කබ ! කබ! කබ! " කියලා කෑගැහුවා !

පුතාගෙ මේ නරක හැසිරීම ගැන ගස් ගෙඹි අම්මා හරිම කනස්සල්ලෙන් හිටියා.

" අනේ, මගෙ රත්තරන් පුතේ, උඹ හොඳ ළමයෙක් වෙයන්. උඹට කවදා මොළේ පෑදෙයි ද මන්දා ?" ඈ කිව්වා. " මාත් කොයි වෙලේ අසනීප වෙයි ද දන්නෑ. "

ඒත් ගෙඹි පුතා දිගට ම කර ගෙන ගියේ හැම දෙයක් ම විරුද්ධ අතට.

දින ගණන් මාස ගණන් ගත වුණා. පුතාගෙ හැසිරීමෙ කිසි ම දියුණුවක් ඇති වුණේ නෑ. කනස්සලු ගතිය වැඩි වෙලා ඉක්මනින් ම අම්මා ලෙඩ වුණා. ගස් ගෙඹි පුතා මුල දී අම්මගේ අසනීපෙ ගැන හිතුවේ නෑ. ඒත් දවසින් දවස අසනීපෙ වැඩි වුණා. වැඩි කල් යන්ට මත්තෙන් මැරෙන්ට ඔන්න මෙන්න තැනට ආවා.

ගෙඹි අම්මා, පුතාට ඇඳ ළඟට කතා කළා. " මගේ පුතේ, මං හිතන්නේ නෑ මං වැඩි කල් ජීවත් වෙයි කියලා. මං මැරුණා ම, මාව කන්දෙ නැතුව, ගඟ ලඟ වළලන්න. " ඈ එහෙම කිව්වාට, ඇත්තට ම ඈට ඕනෑ කළේ එය නෙමේ. ඈට බය හිතුණා , ඈව කන්ද ළඟ වළලන්නට කියලා කිව්වොත්, පුතා ඈව ගඟ ළඟ වළලයි කියලා.

එහෙම කිව්වාට පස්සෙ ඈ මැරුණා. අම්මාට මොන තරම් ලොකු වරදක් කරලා තියෙනවා ද කියලා ගෙඹි පුතාට තේරුම් ගියේ අම්මා මැරුණායින් පස්සෙ විතර යි. ඌ හොඳට ම ඇඬුවා.

" අනේ අම්මේ ! මං වැරදි කළා තමා. අම්මා මැරුණේ මගේ වැරැද්දෙන්. අනේ නැඟිටින්න අම්මෙ, නැඟිටින්න අම්මෙ, නැඟිටින්න ! මං හොඳ කොළුවෙක් වෙන්නම් කො ! " ඌ කළ වැරදිවලට ඌ හොඳට ම පසුතැවිලි වුණා. ඒත් ඒ පරක්කු වැඩි වුණා.

"දැන් ඉඳලාවත් හොඳට වැඩ කටයුතු කරන්නට ඕනෑ" කියලා ගස් ගෙඹි පුතා අඬ අඬා හිතා ගත්තා " මේ වන කල් ම මං අම්මාට කීකරු වුණේ නෑ. මං ගැන දුකින් ම අම්මා මැරුණා. ඒ හින්දා මං අම්මාගෙ අන්තිම ඉල්ලීම වත් ඉෂ්ට කරන්ට ඕනෑ, " ඌ හිතුවා.

ඉතින් ඌ අම්මාව ගඟ අයිනෙ වැළලුවා. ඊට පස්සෙ, වහින හැම දාට ම ගස් ගෙඹි පුතාට අම්මගෙ සොහොන ගැන මතක් වෙන කොට හිතට හරි නෑ, සොහොන ගඟට සේදී යාවි කියලා ඌට බය යි. ඉතින් උගුර බැරැන්ඩි වෙන තුරු ම ඌ දිගට ම කෑගැහුවා.

"බ-කා! බ-කා! බ-කා!"

එසින හැම දාට ම ගස් ගෙම්බා කෑගහන්නේ අන්න ඒ හින්දා යි.



ලාඕස්

කෙලෙහිගුණ නොදත් බල්ලා

ලේඛක
සම්රිත් බෞවාසිසවත්

චිත්‍ර
කොංඑත් ලුවංරත්

එකමත් එක කාලෙක දඩයක්කාරයකුට කම්මැලි බල්ලෙක් හිටියා. එක දවසක් දඩයක්කාරයා මේ බල්ලා ත් ඔහුගේ අනික් බල්ලනු ත් අරන් කැලේට ගියා දඩයම් කරන්ට. කම්මැලි බල්ලා හරි හෙමින් යන හින්දා අනිත් බල්ලන් එක්ක යන්ට ඌට බැරි වුණා. ඉතින් ඉක්මනින් ම ඌ මහ ඇරිලා කැලේ අතර මං වුණා. ඌ බිරුවා, බිරුවා – ඒත් කිසි ම බල්ලෙක් වත් ආපසු බිරුවේ නැහැ. ඉර බැහැලා කළුවර වැටුණා ම ඌට හරියට බය හිතුණා. බඩගින්නෙ යි වතුර පිපාසයෙනු යි ඌ කැලෑවේ එහෙ මෙහෙ ඇවිද්දා.

අන්තිමට ඌ තාපසයකුගෙ පැළට ආවා. තාපසයා පය හෝදන්නට ගන්න වතුර භාජනෙන් ඌ වතුර බීලා පැළ අස්සට වෙලා හොඳට ම නිදා ගත්තා.

කැලේ ඉඳලා තපසයා පැළට ආව ම, බල්ලාට දුක හිතිලා ඌට කන්ට දුන්නා. තාපසයා කන්ට දුන් හින්දා බල්ලා එහේ නතර වුණා.

ඌ කනවා – නිදා ගන්නවා, නිදා ගන්නවා, – කනවා ! එතන ඌ සතුටෙන් හිටිය හින්දා උගේ පරණ ස්වාමියා ගැන මොහොතකට වත් හිතුවේ නැහැ.

ටික කලකට පස්සේ තාපසයාට මෙහෙම දෙයක් හිතුණා. " මේ බල්ලා මෙතනට ආවේ මොකක් හරි කරදරයකින් බේරෙන්ටයි. ඒත් මං තාපසයෙක් හින්දා බල්ලෙක් ඇති කරන එක හොඳ නෑ. මිනිස්සු හිතාවි මං දඩයම් කරන්ට බල්ලෙක් තියා ගෙන ඉන්නවා යි කියලා. මං මොනවා ද දැන් කරන්නේ ? "

තාපසයා හුඟක් කල්පනා කරලා, හොඳ උපායක් ගැන හිතුවා. ඔහුගෙ මන්ත්‍ර බලයෙන්, ඔහු ඒ බල්ලාව ලස්සන රන්වන් මුවකු බවට හැරෙව්වා. තාපසයාගෙ පැළ අවට මුවා තණකොළ කෑවා. හුළඟ වගේ හැතැප්ම ගණන් දුවන්නට පුළුවන් හින්දා ඌ ගැන ඌ හරි ආඩම්බර වුණා.

එක දවසක් තාපසයාගෙ පැළ ළඟ ඌ තණකොළ කකා ඉන්න කොට, ලොකු කොටියෙක් එතනින් යන්න ආවා. මුවා කොටියාව දැක්කා ම, හොඳට ම බය වෙලා තාපසයා ළඟට එක පිම්මේ දිව්වා. තාපසයාට ආයෙමත් සැරයක් ඌ ගැන දුක හිතුණා. "මගේ මේ රත්වත් මුවා හතුරන්ට ලේසියෙන් ම ගොදුරු වෙන්න පුළුවන්. මගෙ මන්ත්‍ර බලය පාවිච්චි කරලා මං ඌ කොටියෙක් කරනවා. එතකොට ඌට නපුරු සතුන්ගෙන් බේරිලා ඉන්ට පුළුවන් නේ. "ඉතින් මුවා කොටියකු වුණා. ඌ වැඩියෙන් සන්තෝස වුණා. ඒ මොකද ? – දැන් ඌට කෑම හොයා ගන්න තාපසයාගේ පැළෙන් තව වැඩි ඈතට යන්න පුළුවන් නේ. ඒ විතරක් නෙමේ – ඌට දැන් තියෙන විශාල ශක්තිය ගැනත් ඌ ආඩම්බර වුණා.

ඔහොම ටිකක් කල් ගත වුණා. එක දවසක් සිංහයෙක් ඌට කඩා පැන්නා. ඌ සිංහයාගෙන් බේරිලා තාපසයාගෙ පැළට දුව ගෙන ආවා. ආයෙමත් සැරයක් තාපසයාට ඌ ගැන දුක හිතුණා.

" කොටියෙක් කරලා මදි. මං ඌව සිංහයෙක් කරවන්නම්. සිංහයා නේ කැලෑවේ ඉන්න හැම සතුන්ට ම වඩා බලවත් සතා, " තාපසයා ඔහුට ම කියා ගත්තා. ඉතින් දැන් කොටියා සිංහයෙක් වෙලා කිසි දේකට බය නැතුව කැලේ පුරා ඇවිද්දා.

එක දවසක් ඌට හරි ම ලස්සන සිංහ දෙනක් මුණ ගැසුණා. මේ සිංහ දෙනට උගේ හිතේ හරි ම ආදරයක් උපන්නා. සිංහ දෙන එක්ක ඌ හරි ම යටහත් විදියට කතා කළා, හුඟක් හොඳට හැසිරුණා. ඒ හින්දා සිංහ දෙනත් ඌට ආදරේ කළා. ඒත් ඌව කසාද බඳිනවා ද කියලා සිංහ දෙනගෙන් ඇහුවා ම, ඈ බැහැ යි කිව්වා.

"මට ඔයාව එක පාරට ම කසාද බඳින්න බැහැ. මට දෙමව්පියො ඉන්නවා. මම එයාලගෙ හොඳ දුවක්. මගේ ජීවිතේ ඕනෑ ම වැදගත් තීරණයක් ගන්ට කලින්, මං දෙමව්පියන්ගෙන් අවසර ගන්ට ඕනෑ. ඔයා මට ඇත්තට ම ආදරේ නම්, මාත් එක්ක ඇවිල්ලා, දෙමව්පියන් හමු වෙලා, මාව කසාද බඳින එක ගැන කතා කරගන්ට ඕනෑ. එහෙම යි කරන්ට හොඳ " සිංහ දෙන එහෙම කිව්වා.

සිංහයා ඇට හුහක් ආදරේ හින්දා ඒකට එකඟ වෙලා ඇගේ දෙමව්පියන් බලන්නට ගියා. ඔවුන්ගෙ දූට ඌ ආදරේ කරන විත්තියත්, ඇව කසාද බඳින්නට ඕනෑ බවත් ඔවුන්ට කිව්වා.

" අපේ දුවව දැන් ම උඹට බඳින්න බෑ. උඹ කවුද කියලා අපි දන්නේ නෑ. උඹ කවුද ? උඹේ දෙමව්පියො කවුද ? උඹේ පවුලෙ විස්තර මොනවා ද ? අපි උඹේ යාළු තාපසයා මුණ ගැහිලා, එයාගෙන් විස්තර දැන ගන්නම්. ඔක්කොම හරියට තියෙනවා නම්, අපි උඹට විරුද්ධ වෙන්නෙ නෑ. එතකොට අපේ දූ උඹට කසාද බැඳ ගන්න පුළුවන්. "

සිංහයාට මේ කතාව ඇහුණා ම ඌ හරි ම කනස්සල්ලට පත් වුණා. "තාපසයා හොඳ මිනිහෙක්. ඒ හින්දා එයා බොරුවක් කියන්නේ නෑ. සිංහ දෙනගෙ දෙමව්පියන් තාපසයා මුණ ගැහෙන්ට ගියා ම, තාපසයා

ඇත්ත කියාවි. – මම කලින් බල්ලෙක් කියලා. මගෙ රහස එතකොට එළි වේවි. එත කොට එයාගෙ දෙමව්පියන් මට එයාව කසාද බඳින්ට ඉඩ දෙන එකක් නෑ " උගෙ හිතට තව තරක සිතිවිල්ලක් ආවා." මම තාපසයාව ඉස්සෙල්ලා මැරුවොත්, එයාට මගෙ රහස කියන්ට බැරි වෙනවා. "

ඉතින් ඌ කෙළින් ම තාපසයාගේ පැළට දිව්වා. පස්ස ගාත් දෙක උස් කරගෙන, වලිගය උඩට උස්සා ගෙන සිංහයා දුවගෙන එන තාලෙන් තාපසයා දැන ගත්තා ඌ එන්නෙ මොකට ද කියලා. සිංහයා කපටි යි – කෙළෙහිගුණ දන්නෙ නෑ. මම ඌව හොඳින් බලා ගෙන, ඌට හොඳින් ජීවත් වෙන්ට උදව් කළා. ඌව බල්ලෙකුගෙන් මුවෙක් කළා, මුවා කොටියෙක් කළා, කොටියා සිංහයෙක් කළා –සේර ම සතුන්ගෙන් බලවත් ම සතා කළා. මම මේ ඔක්කොම ඌට කළා. ඒත් ඌට දැන් මාව මරන්ට ඕනෑ වෙලා. "

සිංහයා දිහාවට හැරිලා තාසපයා මෙහෙම කිව්වා ! " මට දැන් උඹට තව දුරටත් අනුකම්පා කරන්ට බෑ. උඹ කිසි ම වැදගැම්මකට නැති සතෙක්. උඹ කලින් හිටපු බල්ලා ම වේවා ! " තාපසයා මන්ත්‍ර බලයෙන් සිංහයාව ආපසු බල්ලා විදියට හැරෙව්වා. තමන් කළ වැඩේට බල්ලා කොච්චර ලජ්ජා වුණා ද කිව්වොත්, තාපසයාගේ මූණ බලන්නට බැරි වුණා. කොහේ යන්නේ ද වත් නොදැන ඌ කැලේ ඇතුළට දුවගෙන ගියා.

එහෙම යන කොට වෘකයෝ රැළක් ඌව දැකලා ඌ පස්සෙන් එළෙව්වා. වෘකයෝ ඌට කඩා පැනලා, ඌව කීතු කීතුවලට ඉරා දැම්මා. ඒ තමා, ඒ කෙළෙහිගුණ නොදත් බල්ලාගෙ අවසානෙ.

ම්‍යන්මාව

ෂ්වේ ගජ් නම් ගිරා හාමි

ලේඛක

ම්‍යා ම්‍යා තාන්

චිත්‍ර

ක්‍යාවු තුන්

එකමත් එක කාලෙක ගොවියෙක් ගිරවකු කූඩුවක ඇති කළා. ඒ ගිරවාගෙ නම, ෂ්වේ ගජ්.

ෂ්වේ ගජ් ගිරා හාමිට, මිනිහකු වගේ කතා කරන්නට පුළුවන්. ඒ හින්ද ගොවිරාළගෙ පවුලේ සේරමත් ගමේ ළමයිනුත් ගිරා හාමිට ආදරෙයි.

හැම දෙනා ම ආදරේ හින්ද, ගිරා හාමි හරියට ආඩම්බර වුණා. ඌ හිතුවා හැම දෙයක් ම ඌ දන්නවා කියලා. ඒ මදිවට ඌ අනිත් අය පහත් විදියට සැලකුවා. ඒ අයට බැන්නා.

නාකි මුර බල්ලාට ගිරා හාමි නපුරු විදියට බැන්නා. "අපෝ, උඹේ හැටි විතරක් බලු හාමි ! බලපන් කො – තැන් තැන්වල ලොම් හැලිලා. උඹ හරි කැත යි. අනේ දෙයියනේ මගෙන් ඈත් වෙලා ඉඳින්. "

ගිරා හාමි, කිකිළිගෙ මුළු පවුලට ම බැණ වැදුණා. "උදේ එළිවෙනවත් එක්ක අඩලන්න පටන් ගන්නවා. කතක් ඇහිලා ඉන්ට නෑ -

කරව්වලේ ! උඹේ පැටව් ටික හරි ම දඟ යි. උන් ටික හොඳින් බලා ගනින්. උඹත් හැම තිස්සෙ ම ගැස්සුණු ගමන්."

මී මැස්සෙකු දිහා බලමින් ගිරා හාමි මෙහෙම කිව්වා ! " මී මැස්සො, උඹ හරි පුංචි යි. හැම තිස්සේ ම 'ගුමු ගුමු' ගගා යනවා. උඹට මොනවා ද ඔච්චර කරන්ට තියෙන වැඩ ? "

ගොම්මං වෙලාවෙ, කුඹුරෙ ඉඳලා හරක් රාළ ආවා ම ඌ හෙමිහිට තණකොළ කාලා පස්සෙ වමාරන් කනවා. ඡ්වේ ගජ් හරක් රාළ දැක්කා ම ඌට බැණ වැදුණා. "උදේ ඉඳං හවස් වෙනකං ගම පුරා ඇවිදලා, දැන් එනවා මෙතන වමාර වමාර කන්ට."

බලු හාමි වත් කිකිළි වත් මී මැස්සා වත් හරක් රාළ වත් ගිරා හාමි ගැන හොඳට දන්න හින්ද ඌ එක්ක එකට එක කියන්න ගියෙ නැහැ. ඌ කියපු දේ උන් ගණනකට වත් ගත්තෙ නැහැ. උන් දැන හිටියා ඌට කේන්ති යන විත්තියත් ඌ එක්ක වාද කරලා වැඩක් නැති විත්තියත්.

එක දවසක් ගොවිරාළගෙ දෝණි ගිරා හාමිට කවලා කූඩුවෙ දොර වහන්ට අමතක වෙලා ගියා.

ඡ්වේ ගජ් හෙමිහිට කූඩුවෙන් එළියට ආවා. ඌ කූඩුවෙන් පිටත රටතොට දැකලා වත් තිබුණෙ නැහැ. කූඩුවෙ ඉඳලා ගේ ඉස්සරහට වැටී වැටී ගියා. එතනින් ගෙවත්තටත් ගියා.

ගිරා හාමි දැක්කා, මී මැස්සා මී වදයට මල් පැණි ගෙනියනවා. "මී මැස්සො, ඇයි උඹ මල්වලින් පැණි උරන්නෙ ? ඒවලින් උඹ මොනවා ද කරන්නෙ ? " ගිරා හාමි ඇහුවා.

"උඹට දැන ගන්ට ඕනෑ නම් මා පස්සෙන් එන්ට, " මී මැස්සා කියලා ඉස්සර වෙලා ගියා. තුග ගහක් ළඟට ගිහින්, ඒ ගහේ බැඳලා තිබුණු

මීය ඌ ගිරාහාමිට පෙන්නුවා. "අපි ඔක්කොම එකතු වෙලා වැඩ කරලා තමා ඔය මීය බැන්දෙ. මම උරන මල් පැණි, මීය ඇතුලෙ එකතු කරනවා. හැමදම ටික ටික එකතු කරන හින්ද මේ තරම් ලොකු මීයක් බඳින්ට පුළුවන් වුණා. කෑම මදි යි කියලා අපට දැන් බය වෙන්ට ඕනැ නෑ," මී මැස්සා කිව්වා.

" ඕ – හෝ ! මට දැන් පේනවා. මී මැස්සා හැම තිස්සේ ම කඩිසර එක යි," ගිරා හාමි හිතුවා.

තුග ගහ මුල දි කිකිළිත් මුණ ගැහුණා. ඌත් එක්ක කුකුළු පැටව් හය දෙනෙක් කෑම හොය හොයා යනවා. එක පාරට ම කිකිළි කෙකර ගෑවා. කිකිළිට ටිකක් ඈතින් හිටපු කුකුළු පැටව්, දුව ගෙන ඇවිත් කිකිළිගෙ තටු යට හැංගුණා.

ෂ්වේ ගජ්ට මොනවා කරන්න ද කියලා තේරුණේ නෑ. ඉතින් ඒ හින්ද කිකිළි කෑගැහුවා, "ඒයි, ෂ්වේ ගජ්, ඔය පඳුර අස්සෙ හැංගෙන්න !"

ළඟ තිබුණු පඳුර අස්සෙ ෂ්වේ ගජ් හැංගුණා. අතු අස්සෙන් දැක්කා උකුස්සෙක් වේගයෙන් පොළවට පාත් වෙනවා.

උකුස්සා ආවෙ කුකුළු පැටවු ගෙන යන්ට. ඒ වුණාට කිකිළි, කුකුළු පැටව් ටික තටු යට හංගා ගෙන, තරහෙන් කොටන්න වගේ හොට වැනුවා. උකුස්සා කිකිළි ළඟට වත් ගියේ නෑ. ඉක්මනින් ම ආපහු ඉගිලී ගියා.

කිකිළිගෙ කලබල ගතියට දොස් කිව්වාට ෂ්වේ ගජ් පසුතැවෙන්න වුණා. කිකිළි හැම තිස්සේ ම සතුරන් එනවා ද කියලා බල බලා ඉන්න විත්තිය ඌට තේරුණා.

ගිරා හාමි ඊළඟට කුඹුර පැත්තෙ ගියා. එතන හරක් රාළ වැඩ කරනවා ඌ දැක්කා.

" මුළු දවල් කාලෙ ම ඌ වැඩ. ඒක හින්ද යි හවසට ඌ විවේක අරන් වමාරන්නෙ, " ගිරා හාමි හිතුවා.



ඌ ආපහු ගෙදර යන්නට හිතුවා. ගෙදරට ළං වෙනවාත් එක්ක ම ඉස්සරහට වල් බළලෙක් ආවා. බළලා ගිරා හාමිට පැන්නා. අහකට පැනලා උගෙ තියපොතුවලින් යම්තම් බේරුණා. ගිරා හාමිව අල්ලන්න බළලා ආපහු කුරුමානම් අල්ලන කොට, බලු හාමි බුරා ගෙන ඇවිත් බළලා පන්නලා දැම්මා.

ෂ්වේ ගජ් බයේ වෙවුළන්නට පටන් ගත්තා. " අනේ, බලු හාමි, උඹට හුඟක් ස්තුති යි මට කළ උදවුවට. උඹ හරි වෙලාවට ආවේ – නැත් නම් මං ඉවර යි, " ගිරා හාමි කිව්වා.

බලු හාමි හිතා වෙලා මෙහෙම කිව්වා ! "උඹට කන්ට බොන්ට දීලා හොඳින් බලා ගන්න හින්දා, උඹ රටතොට ගැන දන්නෙ නෑ. ඉතින් ෂ්වේ ගජ්, ... තම තමන් ජීවත් වෙන්ට කවුරු කවුරුත් වගකීම බාර ගන්ට ඕනෑ. හැම සතාට ම ජීවත් වෙන්ට හරි ම සටනක් ගෙන යන්ට ඕනෑ.

– හැම තිස්සේ ම තමන්ගෙ සතුරක් ගැන කල්පනාවෙන් ඉන්ට ඕනැ. මින් මතුවට වත්, උඹේ පුංචි ලෝකෙ ඉඳ ගෙන උඹ ගැන විතරක් හිතන්ට එපා. අනික් එක්කෙනාගෙ තැන උඹ ඉන්නවා නම් කියලා හිතලා, ඇත්ත තේරුම් ගනින්. එහෙම කළොත්, උඹට කාරණා තේරිලා මොළේ පෑදේවි. ”

“දැන් මට තේරෙනවා, බලු හාමි, ” කියමින් ගිරා හාමි උගෙ පුංචි කූඩුවට ගියා. හුහක් බඩගින්නෙ හිටිය හින්දා බඩ පිරෙන්න පේර ගෙඩියක් ම කාලා විවේක ගන්නට පැත්තකට වුණා.